ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

(01) සාමාන්‍ය පරිපාලනය

පැ තුනයි

- I හා II කොටස්වලින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

1. (i) 1946 ලංකා රාජ්‍ය සභා ආඥාවේ පාර්ලිමේන්තු මැතිවරණ සම්බන්ධයෙන් "ඡන්ද දායකයා" යන්න අර්ථ දක්වා ඇත්තේ කෙසේදැයි පැහැදිලි කරන්න.
   (ii) ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ පනතට අනුව,
      (අ) ජනාධිපතිවරයා තෝරාගැනීමේ ඡන්ද විමසීම පවත්වන දිනය තීරණය කිරීමට අදාළ විධිවිධාන කවරේ ද?
      (ආ) නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක ඇතුළත් විය යුතු කරුණු මොනවා ද?
   (iii) 1972 ශ්‍රී ලංකා ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව,
      (අ) ක්‍රියාත්මක වූ සරල බහුතර නියෝජන ක්‍රමයේ වාසි හා අවාසි කවරේදැයි වෙනවෙනම විස්තර කරන්න.
      (ආ) බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයක සරල බහුතර නියෝජන ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

2. ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතට අනුව,
   (i) එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා ලියාපදිංචි කිරීමේ නිලධාරියකු පත්කිරීම සම්බන්ධයෙන් වන විධිවිධාන පැහැදිලි කරන්න.
   (ii) ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය කිරීමේ ක්‍රමවේදය කුමක් ද?
   (iii) ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස බෙදා වෙන්කිරීමේ දී ගැසට් පත්‍රයේ පළකළ යුතු දැන්වීම් සම්බන්ධයෙන් වන විධිවිධාන කවරේ ද?
   (iv) විරෝධයපාන්නකු සම්බන්ධයෙන් "ප්‍රතිශෝධනය කිරීමේ නිලධාරියා" යන්න අර්ථ දක්වන්න.
   (v) අසත්‍ය ප්‍රකාශ හා සාවද්‍ය හිමිකම් පෑම සම්බන්ධයෙන් වන දඬුවම් කවරේ ද?

(ලකුණු 20 යි)

3. 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව,
   (i) මූලික අයිතිවාසිකම් යටතේ දැක්වෙන "සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම" යන්න කෙටියෙන් හඳුන්වන්න.
   (ii) "රජය" යන්න අර්ථ දක්වා ඇත්තේ කෙසේ ද?
   (iii) "සෑම පාර්ලිමේන්තුවක්ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් පස් අවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේ ය." යන වගන්තිය සංශෝධනයට ලක් කරන්නේ නම්, ඒ සඳහා වන ක්‍රමවේදය විස්තර කරන්න.
   (iv) සමානුපාතික නියෝජන ක්‍රමයට පවත්වනු ලබන මහ මැතිවරණයක දී ඊට ඉදිරිපත්වන පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම්වලට මන්ත්‍රී ධුර හිමිවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
   (v) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාට පැවරෙන වගකීම් මොනවා ද?

(ලකුණු 20 යි)

[2 වැනි පිටුව බලන්න.

4. පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුව,

(i) (අ) ඡන්ද දායකයකු සම්බන්ධයෙන් "කැටුව යන තැනැත්තා" යන්න අර්ථ දක්වන්න.

(ආ) ඒ සඳහා එම තැනැත්තා තුළ තිබිය යුතු සුදුසුකම් මොනවා ද?

(ii) තැපැල් ඡන්ද දායකයකු වශයෙන් ඉල්ලුම් කිරීමට හිමිකම් ලබන පුද්ගලයන් කවරහු ද?

(iii) තැපැල් ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක් විවෘත කරන ගණන් කිරීමේ නිලධාරියකු විසින් පහත සඳහන් එක් එක් අවස්ථාවේ දී කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.

(අ) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක කිසිම ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් නොවන අවස්ථාවක

(ආ) ඡන්ද පත්‍රිකා ලියුම් කවරයක ඡන්ද පත්‍රිකාවක් ඇතුළත් වන අවස්ථාවක

(iv) පාර්ලිමේන්තු මැතිවරණයක දී නීතිවිරෝධී ක්‍රියා සම්බන්ධයෙන් වරදකරුවකු වන පුද්ගලයකුට හිමිවන දඬුවම් කවරේ ද?

(v) මැතිවරණයක දී යම් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකරනු ලැබූ අවස්ථාවක මහාධිකරණය ඉදිරියේ වරදකරුවකු නොකිරීම සඳහා අපේක්ෂකයකු විසින් ඔප්පු කළ යුතු කරුණු මොනවා ද?

(ලකුණු 20 යි)

II කොටස

5. (i) "U හැඩයේ කාර්යාල පිරිසැකැස්ම" යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) මනා කාර්යාල සැලැස්මකින් ලබාගත හැකි ප්‍රයෝජන කවරේදැයි විස්තර කරන්න.

(iii) මහජනයාට පහසුකම් සැලසෙන අයුරින් කාර්යාලයීය ගොඩනැගිල්ලක් සැලසුම් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු මොනවාදැයි පැහැදිලි කරන්න.

(iv) විවෘත පිරිසැකැස්මට අනුව කාර්යාලයක් සැලසුම් කිරීමේ දී ලබාගත හැකි වාසි හා අවාසි කවරේදැයි වෙනවෙනම විස්තර කරන්න.

(v) රේඛීය සංවිධානය යටතේ කාර්ය මණ්ඩලය සංවිධානය කිරීම රාජ්‍ය ආයතනයක කාර්යක්ෂමතාවයට බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

6. ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව,

(i) (අ) සුළු දඬුවම් යටතේ නිලධාරියකුගේ වැටුප හා සම්බන්ධිතව දෙනු ලබන දඬුවම් මොනවා ද?

(ආ) බරපතල දඬුවම් යටතේ නිලධාරියකුගේ රාජ්‍ය සේවය අවසාන වන ආකාරයෙන් දෙනු ලබන දඬුවම් කවරේ ද?

(ii) ලඝු විනය කාර්ය පරිපාටිය යටතේ නිලධාරියකු සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පැහැදිලි කරන්න.

(iii) රාජ්‍ය නිලධාරියකුගෙන් අපේක්ෂා කරනු ලබන සාමාන්‍ය හැසිරීම කෙබඳුදැයි පැහැදිලි කරන්න.

(iv) විනය නියෝගයක අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු කරුණු මොනවා ද?

(v) කැබිනට් මණ්ඩලය විසින් සෘජුවම විනය පාලන කටයුතු කරනු ලබන නිලධාරීන් කාණ්ඩ කවරේ ද?

(ලකුණු 20 යි)

7. (i) "වැටුප් වර්ධකයක් නතර කිරීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) රජයේ නිලධාරියකු රජයේ සේවයෙන් තාවකාලිකව මුදාහරින ලෙස කරනු ලබන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා මොනවා ද?

(iii) පත්කිරීම් හා උසස් කිරීම් සම්බන්ධයෙන් සම්පූර්ණ කළ යුතු පූර්ව කොන්දේසි මොනවාදැයි විස්තර කරන්න.

(iv) වැටුප් පරිමාණයක් ප්‍රතිශෝධනය කිරීමේ දී ගෙවන වැටුප තීරණය කරන ආකාරය ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව පැහැදිලි කරන්න.

(v) පරිවාස කාලය තුළ දී රජයේ නිලධාරීන් පිළිබඳව ඉදිරිපත් කළ යුතු වාර්ෂික සමාලෝචන වාර්තාවෙන් ඇගයීමක් කරනු ලබන මූලික කරුණු කවරේ ද?

(ලකුණු 20 යි)

[3 වැනි පිටුව බලන්න.

8. (i) රජයේ නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදීමෙන් ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු මොනවා ද?

(ii) රජයේ නිලධාරියකු ස්ථාන මාරුවීමක් ලබා ගිය පසු පූර්ව ආයතන ප්‍රධානියා විසින් නව ආයතන ප්‍රධානියා වෙත යැවිය යුතු ලියකියවිලි මොනවා ද?

(iii) විනය හේතු මත පත්වීම් බලධාරියා විසින් ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරනු ලබන අවස්ථා මොනවා ද?

(iv) රජයේ සේවයෙන් විශ්‍රාම ගිය පසු නැවත සේවයේ යෙදවීමට සුදුසුකම් නොලබන තැනැත්තන් කවරහු ද?

(v) පෞද්ගලික ලිපිගොනුවක ඇතුළත් කරනු ලබන පහත සඳහන් පොදු ආකෘති පත්‍ර මගින් රජයේ නිලධාරියකු සම්බන්ධයෙන් ලබාගන්නා තොරතුරු කවරේදැයි වෙනවෙනම පැහැදිලි කරන්න.

(අ) පොදු 160

(ආ) පොදු 169

(ඉ) පොදු 261

(ඊ) පොදු 278

(ලකුණු 20 යි)

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

(02) මූදල්

පැ තුනයි

- ඕනෑම ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) රජයේ දෙපාර්තමේන්තුවක් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පත් ගිණුමක ඇතුළත් කරනු ලබන තැන්පත් වර්ග හතරක් සඳහන් කරන්න.

(ii) චෙක්පත්වල ආරක්ෂාව සම්බන්ධයෙන් භාවිත කරනු ලබන රේඛන වර්ග හතරක් සඳහන් කරන්න.

(iii) වර්තමානයේ රජයේ දෙපාර්තමේන්තුවක එදිනෙදා කරනු ලබන සාමාන්‍ය ගෙවීම්වල දී හඳුනා ගත හැකි බදු වර්ග හතරක් නම් කරන්න.

(iv) පාසල්වල මූල්‍ය උපයෝජනයේ දී ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා හඳුනා ගෙන ඇති වැය විෂය ක්ෂේත්‍ර හතරක් සඳහන් කරන්න.

(v) මු.රෙ. 102 හි සඳහන් පරිදි ගෙවීම් කටයුතු සිදු කිරීමේ දී සිදු විය හැකි පාඩු හෝ හානි හතරක් සඳහන් කරන්න.

(ලකුණු 20 යි)

2. පහත සඳහන් එක් එක් අවස්ථාවේ දී මූදල් රෙගුලාසි අනුව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කවරේ දැයි පැහැදිලි කරන්න.

(i) වෙනත් තහවුරු කිරීමේ සාක්ෂි ඇති විටෙක රජයේ කාර්යාලයක ගෙවීම් කටයුතු නිම කරන ලද වවුචර් පත්‍ර කිහිපයක් අස්ථානගත වූ අවස්ථාවක දී

(ii) රජයේ ගිණුම පිට නිකුත් කරනු ලබන චෙක්පතක්, එය ලියන විට යම් වරදක් සිදු වූ අවස්ථාවක දී

(iii) දෙපාර්තමේන්තු තැන්පත් ගිණුමෙන් ආපසු ගෙවීමක් සිදු කිරීමට සලකා බැලීමේ දී

(iv) නිලධාරියකු එක් දෙපාර්තමේන්තුවක සිට තවත් දෙපාර්තමේන්තුවකට ස්ථාන මාරු කරනු ලැබූ කල්හි, එම නිලධාරියාගෙන් අයවිය යුතුව ඇති ශේෂ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී

(v) දෙපාර්තමේන්තුවක් සතු මූල්‍යමය වටිනාකමක් ඇති උපපත්‍රිකා පොත් තොගයක් නැති වූ අවස්ථාවක දී

(ලකුණු 20 යි)

3. සෑම පාසලක් තුළම විධිමත් මූල්‍ය කළමනාකරණයක් හා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය සාධකයකි.

(i) පාසල් අධ්‍යාපන සංවර්ධනය උදෙසා මධ්‍යම රජය හා පළාත් සභා යටතේ සම්පාදනය කර ගනු ලබන මූල්‍ය ප්‍රභව මොනවා ද?

(ii) පාසල්වල සුළු මූදල් අග්‍රිම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කර ඇති විධිවිධාන මොනවා ද?

(iii) ප්‍රසම්පාදනයක දී ඉදිරිපත් කරන ලද මිල ගණන් පාසල් තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් ඇගයීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය විස්තර කරන්න.

(iv) මූල්‍යමය ආධාර හෝ පරිත්‍යාග බාර ගැනීමේ දී පාසල් සංවර්ධන සමිතියක් විසින් නිකුත් කළයුතු ලදු පතක ඇතුළත් විය යුතු කරුණු මොනවා ද?

(v) වෙළෙඳපොළ සැඳහුම් ක්‍රමය (shopping method) යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාවලිය සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 20 යි)

[2 වැනි පිටුව බලන්න.

4. පහත සඳහන් එක් එක් අවස්ථාවේ දී අදාළ කාර්යය ඉටු කිරීම සඳහා මුදල් රෙගුලාසි විධිවිධාන යටතේ අනුගමනය කළ යුතු විධිමත් ක්‍රියා පටිපාටිය පැහැදිලි කරන්න.

(i) රාජකාරි ගමනක් සඳහා නිලධාරියකු විසින් ලබාගත් ගමන් වියදම් අත්තිකාරමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී

(ii) ගෙවීම් කටයුතු නිම කරන ලද වවුචර්පත් විගණකාධිපති වෙත යැවීමට කටයුතු කරන අවස්ථාවේ දී

(iii) යම් විශේෂිත කාර්යන් සඳහා නිකුත් කරන තත්කාර්ය අතුරු අග්‍රිමයක් මුදා හැරීමට සිදුවන අවස්ථාවක දී

(iv) ඇප තැබිය යුතු තනතුරකට පත්කර ඇති නිලධාරියකුගේ ඇප මුදල සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී

(v) රජයේ ආදායම් සම්බන්ධ මූල්‍ය පාලනයේ දී ප්‍රතිග්‍රාහක නිලධාරියකු විසින් රැස් කරනු ලබන මුදල් පිළිබඳව කටයුතු කිරීමේ දී

(ලකුණු 20 යි)

5. රජයේ ප්‍රසම්පාදන කටයුතු වඩාත් විධිමත් ලෙස කළමනාකරණය කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දී ඇත.

(i) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු ඇපකරයක් ලබා ගැනීමේ පරමාර්ථ මොනවා ද?

(ii) මූලික කොන්ත්‍රාත් වටිනාකමෙන් 50% ක් නැවත ඇණවුම් ක්‍රමය මගින් භාණ්ඩ සපයා ගැනීම සිදු කිරීමේදී ප්‍රසම්පාදන ඒකකයක් විසින් තහවුරු කර ගත යුතු කරුණු මොනවා ද?

(iii) ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලංසු විවෘත කිරීමේ කමිටුවක් විසින් ලංසු විවෘත කිරීමේ අවස්ථාවේ දී ප්‍රකාශ කළයුතු කරුණු මොනවා ද?

(iv) සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු මොනවා ද?

(v) ලංසු ලියකියවිලි නිවැරදිව ඉදිරිපත් කර තිබුණ ද, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී ලැබුණු සියලුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හේතුවන කරුණු මොනවා ද?

(ලකුණු 20 යි)

6. පහත දැක්වෙන එක් එක් ප්‍රකාශයේ සත්‍ය අසත්‍යතාව හේතු දක්වමින් පැහැදිලි කරන්න.

(i) චෙක්පතක වලංගු කාලය දීර්ඝ කර දීමට පෙර සැලකිය යුතු වන්නේ එය අවලංගු කරන ලද චෙක්පතක් සේ සලකා ඇති ද යන්න පමණි.

(ii) අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් පනවනු ලබන සීමාවන්හි ඇතුළත් වන්නේ උපරිම හර සීමාව හා අවම බැර සීමාව පමණි.

(iii) මුදල් රෙගුලාසි විධිවිධාන අනුව තැපෑලෙන් යැවීමේ දී සියලු චෙක්පත් ලියාපදිංචි කර යැවිය යුතුය.

(iv) ගෙවන ලද සියලුම වවුචරවලත්, එම ගෙවීම තහවුරු කෙරෙන සියලුම ඇමුණුම්වලත් "ගෙවන ලදී" මුද්‍රාව අනිවාර්යයෙන් සටහන් කළ යුතුය.

(v) පාසල් සංවර්ධන සමිතියක් විසින් පවරා ගන්නා ලද ඉදිකිරීම් කාර්යයක් නැවත උපකොන්ත්‍රාත් ක්‍රමයට පැවරිය නොහැකි ය.

(ලකුණු 20 යි)

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

(03) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය

පැ තුනයි

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද II, III හා IV කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න හයකට ද පිළිතුරු සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා, එය අනෙක් කොටස්වලට අදාළ පිළිතුරු පත්‍රය සමඟ අමුණා ශාලාධිපතිට භාර දෙන්න.

විභාග අංකය :.....

I කොටස

1. 2016 වර්ෂයේ නිකුත් කරන ලද පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයට අනුව,
   (i) 2017 වර්ෂයේ පළමුවන ශ්‍රේණියේ පන්තියක සිටිය යුතු උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

   .....

   (ii) ළමයින් ඇතුළත් කිරීමේ දී ළමයාගේ ආගම ගැන සැලකිලිමත් වියයුත්තේ කුමන පාසල් සම්බන්ධයෙන් ද?

   .....

2. පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් තෝරා ගැනීම සඳහා පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සාමාජිකයින් විය යුත්තේ කවරහු ද?

   .....

   .....

   .....

   .....

3. පාසල් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පාසලක දෙවර්ගයක කමිටු පිහිටු වියයුතු වේ. ඒ මොනවා ද?
   (i) .....
   (ii) .....

4. පාසල් සංවර්ධන සමිතියක සාමාජිකයකුගෙන් වාර්ෂික සාමාජික ගාස්තු වශයෙන් අයකර ගත හැකි,
   (i) අවම සාමාජික ගාස්තුව කීයද? .....
   (ii) උපරිම සාමාජික ගාස්තුව කීයද? .....

5. (i) පාසල් ප්‍රසම්පාදන කමිටුවක නිල වශයෙන් සභාපතිවරයා වන්නේ කවරෙක් ද?

   .....

   (ii) පාසලක තාක්ෂණ ඇගයීම් කමිටුවේ සභාපතිවරයා වශයෙන් පත් කර ගත යුත්තේ කවරෙක් ද?

   .....

[දෙවන පිටුව බලන්න.

6. (i) "අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්" යන තනතුර ස්ථාපනය කරන ලද පනත කුමක් ද?

.....

(ii) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබාදුන් තීරණයක් නිෂ්ප්‍රභ කළ හැක්කේ කාහට ද?

.....

7. (i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනතට අනුව "ආධාර ලබන පාසලක්" යන්න නිර්වචනය කර ඇත්තේ කෙසේ ද?

.....

(ii) ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බිහිවූයේ කුමන අධ්‍යාපන පනතින් ද?

.....

8. 1981 අංක 65 දරන ආධාර ලබන උපකෘත පාසල් හා ගුරු විද්‍යාල විශේෂ විධිවිධාන (සංශෝධිත) පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ආධාර ලබාදීම සඳහා පාසලක යෝග්‍ය ගුරු මණ්ඩලය තීරණය කරනු ලබන නිර්ණායක දෙකක් ඇත. එම නිර්ණායක දෙක කවරේ ද?

(i) .....

(ii) .....

9. (i) ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව යටතේ සහතිකකරණය කරනු ලබන සහතික මට්ටම් සංඛ්‍යාව කීයද?

.....

(ii) එම රාමුව යටතේ ඇති ඉහළම මට්ටම කුමක් ද?

.....

10. (i) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රථම වාර්තාව මගින් හඳුනාගෙන ඇති අධ්‍යාපනය සම්බන්ධ ජාතික අරමුණු සංඛ්‍යාව කීයද?

.....

(ii) එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කළ හැකි පොදු නිපුණතා සංඛ්‍යාව කීයද?

.....

(ලකුණු 04 × 10 = 40 යි)

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන
පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2016 (2017)

(03) අධ්‍යාපනය, අධ්‍යාපන නීතිය, පරිපාලනය හා අධීක්ෂණය

II කොටස

11. (i) 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනතට අනුව අධ්‍යාපන ඇමතිවරයා විසින් අනුමත කාරණයක් සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න.

(ii) 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත යටතේ අධ්‍යාපන ඇමතිවරයා විසින් රෙගුලාසි පැනවීමේ දී ඉහත (i) හි සඳහන් ක්‍රියාමාර්ගයට වෙනස් වන්නේ කෙසේ ද?

(ලකුණු 10 යි)

12. 1951 අංක 5 දරන අධ්‍යාපන (සංශෝධිත) පනත යටතේ පනවන ලද රෙගුලාසි අනුව ඉගැන්වීමේ මාධ්‍යය සම්බන්ධයෙන් දක්වා ඇති විධිවිධාන කවරේ ද? *(ලකුණු 10 යි)*

13. පාසල් මණ්ඩල පිහිටුවීම සම්බන්ධයෙන් වර්තමානයේ පවතින නෛතික තත්ත්වය කෙබඳුදැයි පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

14. (i) එක්සත් ජාතීන්ගේ සම්මුති දෙකක් මගින් අධ්‍යාපනයට ඇති අයිතිය තහවුරු කර තිබේ. එම සම්මුති දෙක නම් කරන්න.

(ii) ඉන් එක් සම්මුතියක් තෝරාගෙන, එහි අධ්‍යාපන අයිතිය සම්බන්ධයෙන් පැහැදිලි කර ඇති විධිවිධාන කවරේදැයි දක්වන්න.

(ලකුණු 10 යි)

III කොටස

15. (i) අධ්‍යාපන අමාත්‍යාංශයේ වර්තමාන සංවිධාන ව්‍යුහය රූප සටහනකින් දක්වන්න.

(ii) එහි කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් යෝජනා කරන්න.

(ලකුණු 10 යි)

16. (i) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්පාදනය සඳහා දැනට පවතින ක්‍රමවේදය කෙබඳුදැයි විස්තර කරන්න.

(ii) එම ක්‍රමවේදය තුළ පවතින අඩුපාඩුකම් කවරේ ද?

(ලකුණු 10 යි)

17. (i) පළාත් අධ්‍යාපන අධිකාරිය යටතේ දැනට පවතින විවිධ මට්ටම් කවරේදැයි දක්වන්න.

(ii) පද්ධතියේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා එහි ඇති කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ප්‍රතිසංවිධානය කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

18. (i) "අන්තර්කරණ අධ්‍යාපනය" යන සංකල්පය පැහැදිලි කරන්න.

(ii) එය ක්‍රියාත්මක කිරීමෙන් ඇති වන යහපත් හා අයහපත් ප්‍රතිඵල මොනවා ද?

(ලකුණු 10 යි)

[හතරවන පිටුව බලන්න.

IV කොටස

19. (i) පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීමේ ප්‍රධාන අරමුණු මොනවා ද?

(ii) එම විභාගයේ උග්‍ර තරගකාරීත්වය වැළැක්වීම සඳහා ගත හැකි ප්‍රායෝගික ක්‍රියාමාර්ග කවරේ ද?

(ලකුණු 10 යි)

20. (i) පාසල් අධීක්ෂණය හා ගුණාත්මක සහතිකකරණය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ii) පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහතිකකරණය සඳහා සුදුසු ක්‍රියාවලියක් යෝජනා කරන්න.

(ලකුණු 10 යි)

21. (i) අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත "ඔබේ පාසල කොතරම් ගුණාත්මකද?" යන ප්‍රකාශනයේ ඇගයීම් ක්ෂේත්‍ර අටක් දක්වා ඇත. ඒවායින් හයක් නම් කරන්න.

(ii) මෙම ක්ෂේත්‍ර යටතේ ඇති නිර්ණායක භාවිත කර පාසලක අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

22. (i) දැනට පාසල්වල ක්‍රියාත්මක කරනු ලබන පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ පැහැදිලි කරන්න.

(ii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමේදී දක්නට ලැබෙන අඩුපාඩු කවරේ ද?

(ලකුණු 10 යි)

* * *